**නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**

# රැකියා අවස්ථා

**ISO 9001:2015 ජාත්‍යන්තර තත්ව සහතිකයෙන් පිදුම්ලත් ප්‍රධාන පෙළේ රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව පහත සඳහන් තනතුරු සඳහා සදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. සහකාර සාමාන්‍යාධිකාරී (යන්ත්‍රෝපකරණ) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු තාක්ෂණවේදී යාන්ත්‍රික ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය/ ලන්ඩන් ඉංජිනේරු සභාව/ ලන්ඩන් ඉංජිනේරු ආයතනයේ III වන අදියරේ විභාගය සමත්වී තිබීම

සහ

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයෙකු වීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සංස්ථාගත සාමාජිකත්වය හෝ ප්‍රවීන (Fellow) සාමාජිකත්වය ලබා තිබීම

සමඟ

මූලික උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තම විෂය ක්ෂේත්‍රයට අදාල තනතුරක අවම වශයෙන් වසර පහළොවක් (15) ක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- **HM 1-1 රු. 140,640 - 15 x 4,100 - 202,140/=**
**වයස් සීමාව** :- අවරුදු 35 ත් - 55 ත් අතර විය යුතුය.

## 02. පරිසර නිලධාරී II ශ්‍රේණිය - තනතුරු 02

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිසර විද්‍යාව පිළිබඳ මූලික උපාධියක් ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## 03. අභ්‍යන්තර විගණන නිලධාරී II ශ්‍රේණිය - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණය/වාණිජ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම

හෝ

ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ආයතනය (ICA) /වරලත් කළමනාකරණ ගිණුම් ආයතනය (CIMA) / වරලත් සහතකලත් ගණකාධිකාරි ආයතනය(ACCA) අන්තර් මාධ්‍ය විභාගය සමත්වීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක /සංස්ථාවක/මණ්ඩලයක හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

## 04. ඉඩම් නිලධාරී II ශ්‍රේණිය - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූලික උපාධියක් ලබාගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/මණ්ඩලයක හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

- අදාල ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ඇති අයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
- රජයේ ආයතනයක ඉඩම් අත්පත් කර ගැනීම ආශ්‍රිත ක්‍රියාකාරකම්වල පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

## 05. සැපයුම් නිලධාරී II ශ්‍රේණිය - තනතුරු 01

## 06. ගබඩා නිලධාරී II ශ්‍රේණිය - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූලික උපාධියක් ලබාගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

- අදාල ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ඇති අයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

## 07. පාලන නිලධාරී II ශ්‍රේණිය - තනතුරු 02

## 08. මානව සම්පත් සංවර්ධන නිලධාරී II ශ්‍රේණිය - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූලික උපාධියක් ලබාගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

- අදාල ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ඇති අයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ආදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

## 09. ජ්‍යෙෂ්ඨ පද්ධති ක්‍රියාකරු II ශ්‍රේණිය - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය / පරිගණක විද්‍යාව පිළිබඳ මූලික උපාධියක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාල වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම.
02. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළගත් තාක්ෂණික /වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 7 වන මට්ටමට (NVQ Level 07) නොඅඩු අදාල ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
03. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් තාක්ෂණික /වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 6 වන මට්ටමට (NVQ Level 06) නොඅඩු අදාල ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

    සහ

    අදාල ක්ෂේත්‍රයේ සුදුසුකම ලැබීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක /ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් ලබා තිබීම.
04. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් තාක්ෂණික /වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 5 වන මට්ටමට (NVQ Level 05) නොඅඩු අදාල ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

    සහ

    අදාල ක්ෂේත්‍රයේ සුදුසුකම ලැබීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක /ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු දහයක (10) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ආදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**ඉහත තනතුරු සඳහා වැටුප් පරිමාණය** :- **JM 1-1 රු . 72,650 - 10 x 1,360 - 18 x 2,040 - 122,970/=**
**වයස් සීමාව** :- අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.

## 10. බලාත්මක කිරීමේ නිලධාරී III ශ්‍රේණිය - තනතුරු 06

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භූගෝල විද්‍යාව/භූ විද්‍යාව/මැනුම් විද්‍යාව හෝ භෞතික විද්‍යාව පිළිබඳ උපාධියක් සමඟ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ මූලික උපාධිය ලබාගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් පිළිබද අවම වශයෙන් වසර තුනක (03) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ආදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- **MA 5-1 රු . 58,740 - 10 x 1,190 - 15 x 1,360 - 11 x 1,670 - 109,410/=**
**වයස් සීමාව** :- අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.

**කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව ඉහත වැටුප් තල 2027.01.01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.**

සියලුම ජීව දත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ පහත සඳහන් ලිපිනයට 2025.10 .31 **හෝ ඊට පෙර** ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ඉල්ලුම් කරන තනතුරෙහි නම අදාල ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරෙහි පැහැදිලිව සඳහන් කල යුතුය. අදාල අයදුම්පත්‍රය www.landdevelopment.lk වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන),**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.**

*සභාපති*
*ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව*
*අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.*
*වෙබ් අඩවිය:* www.landdevelopment.lk